# ශ්‍රී ලංකා නාවික හමුදා ජල ශාස්ත්‍රීය සේවා කාර්යාලය විවෘත වෙයි

■ අමිත් මධුරංග/ඡායාරූප-ශමීර රාජපක්ෂ

නව තාක්‍ෂණික ක්‍රමෝපායන් මගින් මෙරට මුහුදු සිතියම් යාවත්කාලීන කිරීමේ කර්තව්‍යය වඩාත් කාර්යක්‍ෂමව හා වේගවත්ව සිදු කරගැනීමේ අරමුණින් නාරා ආයතනය තුළ අභිනවයෙන් ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා නාවික හමුදා ජල ශාස්ත්‍රීය සේවා කාර්යාලය ඊයේ (10දා) විවෘත කළේය.

මෙම කාර්යාල පරිශ්‍රය උපකාර කරගනිමින් ශ්‍රී ලංකා නාවික හමුදාව සතු නාවික සිතියම් නිර්මාණය කරගැනීම, යාවත්කාලීන කරගැනීම සහ දත්ත අලෙවි කිරීම මගින් විදේශ විනිමය උපයාගැනීමට හැකියාව ලැබෙනු ඇත.

ඉන්දියාව, පාකිස්තානය, බංග්ලාදේශය, මියන්මාරය ඇතුළුව ලෝකයේ බොහෝ දියුණු රටවල් ආර්ථික සංවර්ධනය සඳහා ජල ශාස්ත්‍රීය සේවාව ඉතාම සක්‍රියව භාවිතයට ගනු ලැබුවද ශ්‍රී ලංකාවට ආගන්තුක මෙම ක්‍ෂේත්‍රය සක්‍රියව ක්‍රියාවට නංවා රටේ ආර්ථික සංවර්ධනයට ජල ශාස්ත්‍රීය සේවාව දායක කරගැනීමට බලාපොරොත්තු වන බව ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහන් කරයි.

වර්තමානයේ ශ්‍රී ලංකා නාවික හමුදා ජල ශාස්ත්‍රීය සේවාවට අනුයුක්තව, ජාත්‍යන්තර ජල ශාස්ත්‍රීය කාර්යාලය මගින් පිළිගත් 'ඒ' ශ්‍රේණියේ ජල ශාස්ත්‍රීක මිනින්දෝරුවන් 20 දෙනෙකු සහ 'බී' ශ්‍රේණියේ ජල ශාස්ත්‍රීක මිනින්දෝරුවන් 15 දෙනෙකු අර්ධකාලීනව නාවික ජල ශාස්ත්‍රීක සේවයට අනුයුක්තව රාජකාරි කරන බවද, මිනුම් සහායක නාවිකයන් 85 දෙනෙකු පූර්ණකාලීනව රාජකාරි කරන බවද නාවික හමුදාව ප්‍රකාශ කරයි.





නාරා ආයතනය හා ඒකාබද්ධ වීමට පෙර ශ්‍රී ලංකා නාවික හමුදාව ජාතික ජල ශාස්ත්‍රීය අවශ්‍යතාවන් සඳහා සිය දායකත්වය ලබා දී ඇති බවත්, ආරක්‍ෂක අමාත්‍යාංශයේ සහ නාගරික සංවර්ධන අධිකාරියේ ඉල්ලීම් මත ඇළ මාර්ග, වැව්, අමුණු සහ ගංගාවල මිනුම් කටයුතු සිදුකර ඇති බවත් එම හමුදාව වැඩිදුරටත් සඳහන් කරයි.

නව කාර්යාල සංකීර්ණය විවෘත කිරීමේ අවස්ථාවට ධීවර හා ජලජ සම්පත් අමාත්‍ය මහින්ද අමරවීර, නාවික හමුදාපති වයිස් අද්මිරාල් රවීන්ද්‍ර විජේගුණරත්න යන මහත්වරුන් ඇතුළු පිරිසක් එක්ව සිටියහ.